## නැවත පදිංචිකරවීමේ අධිකාරිය - 2013

නැවත පදිංචිකරවීමේ අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශණයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචිකරවීමේ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මෙහෙයුම්, ආයෝජන හා මූල්‍යකරණ කටයුතු වලින් ජනිතවන මුදල් ප්‍රවාහයන් වෙනම දැක්වෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

නැවත පදිංචි කරන පවුල් සඳහා සිමෙන්ති සහ සෙවිලි තහඩු ලබාදීමට මඩකළපුව දිස්ත්‍රික් ලේකම් වෙත රු.2,890,862 ක ප්‍රතිපාදන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී මාරුකර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත්වූ පවුල් 119 කට මෙම උපකරණ ලබාදුන් බව දක්වා තිබුණු නමුත් එම මිළදී ගැනීම් සනාථ කෙරෙන වියදම් විස්තර හෝ බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ 1 කොටසේ 12 වගන්තිය | උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන අවතැන්වූ ජනතාව නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා එම ප්‍රදේශවල පිහිටවිය යුතු ශාඛා කාර්යාල 2014 මැයි 31 දින තෙක් පිහිටුවා නොතිබුණි. |
| (ආ) | 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ 111 කොටසේ 20 (1) වගන්තිය | අධිකාරියට ස්වාධීන අරමුදලක් තිබිය යුතු වුවත් එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.170,208 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.414,455 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.584,663 ක පිරිහීමක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

නැවත පදිංචි කරවීමේදී පුද්ගලයින්ට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටළු වන ආහාර, ජලය, සනීපාරක්ෂක පහසුකම්, හානිවූ නිවාසවලට පිළියම් යෙදීම, අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයින්ගේ සුභ සාධනය හා අභිවෘද්ධිය ඇතුළු ක්ෂණික මානුෂීය ආධාර ලබාදීම හා යටිතලපහසුකම් ලබාදීම, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ මැදිහත්වීම මත නැවත පදිංචි කරවීමේ අධිකාරිය විසින් සිදුකරනු ලබයි. 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද මෙම අධිකාරියේ කාල සීමාව අවුරුදු 06 ක් විය. එය 2013 පෙබරවාරි 22 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් පාර්ලිමේන්තුව විසින් පනවන ලද නියෝග මත නැවත පදිංචිකිරීමේ අමාත්‍යවරයා විසින් අධිකාරියේ කාල සීමාව 2013 මාර්තු 31 දින වන විට තවත් වසර 03 ක කාලයක් සඳහා දීර්ඝ කර තිබුණි.

නැවත පදිංචිකරවීමේ අධිකාරිය 2007 අංක 09 දරන පනත අනුව මූලික අරමුණු 02 ක් සහ කාර්යයන් 14 ක් දක්වා ඇති නමුත් එම අරමුණුවලට ළඟාවිය හැකි ආකාරයේ යෝජනා හෝ 2013-2016 කාලය සඳහා සංයුක්ත සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ සභාපතිවරයා වෙත වෙන්කරන ලද වාහනයට අමතරව, සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කැඳවීමකින් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු.40,000 ක මාසික කුලී පදනම මත වාහනයක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා රු.400,000 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) අධිකාරියේ 2013-2015 කාලය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය බාහිර පාර්ශවයකට පවරා තිබුණි. මෙම කාර්ය සඳහා ගිවිසුම් ගත මුදල රු.500,000 ක් වූ අතර ඉන් රු.230,457 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. 2014 සැප්තැම්බර් 30 දින වන විට අදාළ සංයුක්ත සැළැස්ම පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ අරමුණු සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා, රට අභ්‍යන්තරයේ අවතැන්වූ තැනැත්තන්ගේ සහ සරණාගතයන්ගේ තොරතුරු ලබාගෙන ඒ අනුව කාර්යයන් ඉටුකිරීම කළ යුතු වුවද, එම දත්ත ලබාගැනීමට අවශ්‍ය සැළසුම් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඇතුළත් වූ ඉංජිනේරුවරයකු, තාක්ෂණික නිලධාරියකු සහ සැලසුම් ශිල්පියෙකුගේ තනතුරු 2007 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය තුළ සංවර්ධන සහකාර තනතුරු 04 ක පුරප්පාඩු පැවතිණි. මෙම පුරප්පාඩු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර තිබුණු නමුත් 2014 මැයි 31 දින දක්වාම අදාළ බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියේ අරමුණු සහ කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටුකර ගැනීමට නොහැකිවීම කෙරෙහි එම තත්ත්වයන්ද හේතුවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

අධිකාරිය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.2,890,862 ක මුදලක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් වෙත මුදාහැර ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාකාරකමක් සිදුවී නොතිබුණි.

**5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

2003 ජුනි 02 දිනැති පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය පරිදි සෑම මාසයකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. එම රැස්වීම් සඳහා මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව ඇගයීම් සඳහා වූ කාර්ය සාධන වාර්තාවන් ඉදිරිපත් කර සමාලෝචනය කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව සංවිධානයේ සභාපතිවරයා වෙත වරින් වර වාර්තා කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය
(ආ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම